# 12 පාඩම - විකල්ප ආරවුල් නිරවුල්කරණය

## විෂය නිර්දේශය මත බර තැබීම - 12 %

## පරිච්ඡේද අන්තර්ගතය

- ⇨ විකල්ප ආරවුල් නිරවුල්කරණය හැඳින්වීම
- ⇨ සමථකරණය
- ⇨ බේරුම්කරණය

# විකල්ප ආරවුල් නිරවුල්කරණය හැඳින්වීම

- යම් ආරවුලක් අදාලව ඊට සම්බන්ධ පාර්ශවයන්ට එම ආරවුල විසඳා ගැනීම සඳහා ඇති අවසාන විසඳුම වන්නේ අධිකරණයක් හමුවේ නඩු පවරා ඒ සම්බන්ධයෙන් තමා බලාපොරොත්තු වන සහනයන් අධිකරණය වෙතින් අයැදීමයි.
- එහෙත් අධිකරණයක් හමුවේ නඩු පැවරීමේ ක්‍රියාවලිය මිල අධික, තරමක පීඩාකාරී සහ සංකීර්ණ ක්‍රමවේදයක් වන අතර ඒ සඳහා පාර්ශවයන්ගේ ශ්‍රමය සහ කාලය වැය වීමක්ද සිදුවේ.
- අධිකරණයක් වෙත නොගොස් ඉන් පරිබාහිරව ආරවුල් විසඳා ගැනීම විකල්ප ආරවුල් නිරවුල්කරණය ලෙස හැඳින්වේ.
- විකල්ප ආරවුල් නිරවුල්කරණය වෙත යොමුවීම මගින් ඉහත සඳහන් කල ආකාරයේ ගැටලු අවහිරතා සහ අපහසුතා අවම වීමක් සිදුවේ.

# විකල්ප ආරවුල් නිරවුල්කරණයේ වැදගත්කම

- එය සඳහා විශාල කාලයක් අවශ්‍ය නොවේ.
- එමගින් අධිකරණයේ කාර්ය භාරය පහසු වේ.
- පාර්ශවයන් අතර සුහද මිත්‍රශීලී විසඳුමකට එමගින් මග පෑදෙයි.
- සුහද මිත්‍රශීලී විසඳුමක් වන නිසාම එම ආරවුලට ලැබෙන විසඳුම කල් පවතින විසඳුමකි.
- විකල්ප ආරවුල් නිරවුල්කරණය වෙත යොමු වන පාර්ශවයන්ට එම ක්‍රමවේදය සහ එහි පියවරයන් සහ කාර්ය පටිපාටිය පිලිබඳව විධිමත් දැනීමක් තිබීම අවශ්‍ය නොවේ.
- අධිකරණමය කාර්ය පටිපාටිය මෙන් නොව විකල්ප ආරවුල් නිරවුල්කරණ කාර්ය පටිපාටිය තුල ඇත්තේ අවම විධිමත්භාවයකි.
- ආරවුලට සම්බන්ධ පාර්ශවයන්ට ස්වේච්ඡාවෙන් තම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සැලසේ.

# විකල්ප ආරවුල් නිරවුල්කරණයේ වාසි

- ආරවුල විසඳීමට ගතවන කාලය අවම වීම
- ආරවුල විසඳීමට වැය වන මුදල අවම වීම
- ආරවුලට අදාල පාර්ශවයන් විසින්ම කරුණු දැක්වීමට අවස්ථාවක් පාර්ශවකරුවන්ට හිමිවේ.
- නම්‍යශීලී සහ නිර්මාණශීලී විකල්පයන් ඔස්සේ ආරවුල විසඳාගැනීමට හැකිවීම
- ආරවුලට සම්බන්ධ පාර්ශවයන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් සම්බන්ධයෙන් සාකච්ඡා කරනු වෙනුවට වැදගත් කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ.
- ජයග්‍රාහකයෙක් සහ පරාජිතයෙක් නිර්මාණය කිරීම වෙනුවට දෙපාර්ශවයේම මධ්‍යස්ථ අදහසක් විසඳුමක් ජයග්‍රහණය කිරීමට කටයුතු සැලැස්වීම
- යහපත් ප්‍රතිපල ලබා දීම
- පීඩනය අඩු වීම
- ආරවුල විසඳන ආකාරය සහ එහි විසඳුම පිලිබඳව බාහිර සමාජයට නිරාවරණය වීම අවම වීම
- ඕනෑම අයෙකුට නොමිලේ ප්‍රවේශ වීමේ හැකියාව

# විකල්ප ආරවුල් නිරවුල්කරණයේ අවාසි

- එමගින් ආරවුල නොවිසඳුනහොත් කාලය සහ මුදල් අපතේ යාමක් සිදු වීම
- අවිධිමත් බව සහ බලය අපයෝජනයට වැඩි ඉඩක් පැවතිම
- ආරවුල විසඳීමට යොදා ගන්නා කාලය සාපේක්ෂව අඩු වීම
- පූර්ව නිගමන යොදා ගැනිමට ඇති අවස්ථාව අවම වීම
- පාර්ශවයන්ට ඇති කේවල් කිරිමේ හැකියාව සීමිත වීම
- ආරවුල විසඳීමේ කාලය වැඩි කිරීමේ හෝ විසඳීම අඩාල කිරීමේ උපායක් ලෙස ඇතමුන් විසින් විකල්ප ආරවුල් නිරවුල්කරණය යොදා ගැනිම
- කාර්යපටිපාටිය සමග පවතින නුහුරු බව සහ අල්ප දැනුවත්භාවය
- තොරතුරු අනාවරණය කිරීම සහ සන්නිවේදනයන්හි සද්භාවය , පාර්ශවයන්ගේ සද්භාවය මත රඳා පැවතීම ( විකල්ප ආරවුල් නිරවුල්කරණ කාර්ය පටිපාටිය තුලදී මෙන්ම එහි අවසාන විසඳුම පිලිබඳව තොරතුරු අනාවරණය කිරීම සහ සන්නිවේදනය කිරීම )

# මෙරට ඇති විකල්ප ආරවුල් නිරවුල් කිරීමේ ක්‍රම

- සමථකරණය
- සමගිකරණය
- බේරුම්කරණය

# සමථකරණය

- අපගේ විෂය නිර්දේෂය තුල සමථකරණය යන්න විවිධ ආකාරයට විස්තර කර ඇත.
- මධ්‍යස්ථ පාර්ශවයක මැදිහත්වීම ඔස්සේ ආරවුලට සම්බන්ධ පාර්ශවයන් අතරේ සාමකාමී සමථයක් හෝ සම්මුතියක් ඇති කර ගැනීමට දරණ උත්හාසයක් සමථකරණය යන්නෙන් අදහස් වේ.
- තෙවන පාර්ශවයක ක්‍රියාකාරී සහභාගීත්වයක් ඔස්සේ එකඟ විය හැකි කරුණු සෙවීමට සහ ආරවුලට සම්බන්ධ අයවලුන් සාධාරණ ප්‍රතිපලයක් වෙනුවෙන් එකඟ කරවාගෙන නෛතික ආරවුලක් සමථ කරවා ගැනීමේ උත්සාහයක් සමථකරණය යන්නෙන් අදහස් වේ.
- සමථකරු යැයි හඳුන්වනු ලබන පුහුණු තෙවන පාර්ශවයක් විසින් සිදු කරනු ලබන ආරවුල් නිරවුල් කිරීමේ අවිධිමත් ක්‍රියාවලියක් සමථකරණය යන්නෙන් අදහස් කෙරේ.
- එකඟතාවයක්, සමථයක් හෝ සම්මුතියක් ඇති කරවා ගැනීම වෙනුවෙන් ආරවුල්කරුවන් දෙදෙනෙක් හෝ වැඩි පිරිසක් අතරට මැදිහත් වීම සඳහා භාවිතා කරන ක්‍රියාවලියක් සමථකරණය යන්නෙන් අදහස් වේ.
- සමථකරණය යනු විවාදිත පාර්ශවයන්ට පිලිගත හැකි සමථයකට ලඟා වීම උදෙසා එකී ක්‍රියාවලියට සහාය දක්වන සහ පහසුකම් සපයනු ලබන තෙවන පාර්ශවයක් ( සමථකරු ) විසින් මෙහෙයවනු ලබන එදිරිවාදී නොවන ක්‍රියාවලියකි.

- සමථකරණයේදී යොදා ගන්නා මූලධර්මයන් , බේරුම්කරණය සහ සමගිකරණය යන සෙසු විකල්ප ආරවුල් නිරවුල් කිරීමේ ක්‍රමයන්ට වඩා වෙනස්ව පවතී.
- සමථකරණයේදී සමථකරුවන් පක්ෂග්‍රාහී ලෙස ක්‍රියා කිරීම හෝ තීන්දු තීරණ ගැනීම සිදු නොකරන අතර තීරණයක් හෝ නිර්දේශයක් යෝජනා කිරීම සඳහා සමථකරුවන් පූර්වයෙන් මැදිහත් නොවේ.
- තවද සමථකරණ ක්‍රියාවලියේදී ඉදිරිපත් කරනු ලබන ලේඛණ සහ සාකච්ඡා කරනු ලබන සියලු කාරණාවන්ගේ පූර්ණ රහස්‍යභාවය රැකීමය සෑම සමථකරුවෙකුම බැඳී සිටියි. සමථකරණයේදී සිදු කරන ලද වරද පිලිගැනීමක් අධිකරණය හමුවේ ( එනම්, අධිකරණ කටයුත්තකදී ) වලංගු නැත. එමනිසා සමථකරණ ක්‍රියාවලියේදී පූර්ණ අවංකභාවයෙන් යුතුව කරුණු ඉදිරිපත් කිරීමට ආරවුලට සම්බන්ධ පාර්ශවයන්ට හැකියාව පවතී.
- සමථකරණයේදී පාර්ශවයන් විසින් සමථයක් සඳහා එකඟ වන අවස්ථාවකදී ඊට අදාල සමථ කොන්දේසීන් මත එම පාර්ශවයන් බැඳ තබන අතර එය වලංගු ගිවිසුමක් / සමථයක් ලෙස නීතිය ඉදිරියේදී සැලකේ.

✕✕ තවද සමථ මණ්ඩල හමුවේදී නීතීඥ නියෝජනයකට අවකාශ නැත. ✕✕

# සමථකරණ කාර්යපටිපාටිය

- සමථකරුවන් විසින් ආරවුලය සම්බන්ධ දෙපාර්ශවයට ඔවුනොවුන් හඳුන්විදීමට ඉඩ සැලසීම සහ ඔවුන්ගේ වර්තමාන තත්වය පිලිබඳව පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දීම

⬇

සමථකරු විසින් වෙන්වෙන්ව පාර්ශවකරුවන්ට සවන් දීම

⬇

සමථකරු විසින් පාර්ශවයන් අතර පවතින දුර්වලතා හඳුනාගෙන අධිකරණය වෙත නොගොස් එම ආරවුල විසඳා ගැනීම සඳහා හවුල් වීම

⬇

පාර්ශවයන් විසින් ඉදිරිපත් කරන විකල්පයන් වෙත සවන් දීම

⬇

| | |
|---|---|
| ⬇ | ⬇ |
| පාර්ශවයන් අතර සමථයක් පවති නම් සමථ කොන්දේසි ඇතුලත් ගිවිසුමක් අත්සන් කිරීම | සමථයක් නොවේ නම් නිරවුල් නොකිරීමේ සහතිකයක් නිකුත් කිරීම |


සැකසුම - කේ.ඩී. ප්‍රභාත් විජයසිරි ( LLB, AAL )

# සමථකරණයට අදාල අණපනත්

- 1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනත සහ ඊට අදාල 1997 අංක 15 , 2011 අංක 04 සහ 2016 අංක 9 දරණ සංශෝධනයන්
- 2003 අංක 21 දරණ සමථ මණ්ඩල ( විශේෂ වර්ගවල අරවුල් ) පනත
- 2000 අංක 44 දරණ ශ්‍රී ලංකාවේ වාණිජ සමථ මධ්‍යස්ථාන පනත

JMC vLearning "your virtual learning partner"

- 1988 සමථ මණ්ඩල පනත සහ එහි සංශෝධනයන්ට අනුව වර්තමානයේදී වටිනාකම රු. ලක්ෂ 5 නොඉක්මවන මූල්‍ය ආරවුල් පිලිබඳව අධිකරණය හමුවේ නඩු පැවරීමට පෙර සමථ මණ්ඩලය වෙත එම ආරවුල ඉදිරිපත් කර නිරවුල් නොකිරීමේ සහතිකයක් සමග අදාල නඩුව ගොනු කිරීම අනිවාර්යය වේ.
- රජය පාර්ශවයක් වන ආරවුල් සමථ මණ්ඩලය වෙත යොමු කරනු නොලැබේ.
- සමථ මණ්ඩලයක් වෙත ආරවුලක් යොමු කල හැක්කේ කාටද ?

- සමථකරුවන් පත්කිරීම, ඉවත් කිරීම, විනය පාලනය, සමථකරුවන්ගේ කාර්යභාරය සුපරීක්ෂණය කිරිම ආදී කටයුතු සමථ මණ්ඩල කොමිසම වෙත පැවරී ඇත.
- ඉහත පනත අනුව බලාත්මක කර ඇති සමථ වර්ග වනුයේ වාණිජ සමථකරණය සහ ප්‍රජා සමථකරණයයි.

# බේරුම්කරණය

- බේරුම්කරණය යනු 100 % ක්ම අධිකරණ ක්‍රියාදාමයක් නොවූවත් එය යම් දුරකට අධිකරණමය ක්‍රියාදාමයකට සමාන වේ.
- බේරුම්කරණයේ ප්‍රතිලාභයන් වන්නේ
  - ■ ලාභදායී වීම සහ
  - ■ අධිකරණ රීතීන් සේ දෘඩ නොවීම

- ස්වේච්ඡා බේරුම්කරණය සහ අනිවාර්ය බේරුම්කරණය ලෙස බේරුම්කරණය කොටස් දෙකකි.
- බේරුම්කරණයේදී සිදු වන්නේ ස්වාධීන තෙවන පාර්ශවයක මැදිහත්වීම මත ආරවුලක් විසඳා ගැනීමයි.
- අන්‍යෝන්‍ය එකඟත්වය මගින් හෝ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මගින් පත් කරනු ලබන අපක්ෂපාතී පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක විනිශ්චයට, ආරවුලේ පාර්ශවයන් විසින් ස්වකීය වෙනස්කම් ඉදිරිපත් කරන්නා වූ ක්‍රියාවලියක් බේරුම්කරණය ලෙස හැඳින්වෙන බව THE AMERICAN HERITAGE DICTIONARY OF THE ENGLISH LANGUAGE හි සඳහන් වේ.



JMC vLearning "your virtual learning partner"

- අතීතයේදී වෙළඳුන් අතරේ ආරවුල් නිරවුල් කිරීම සඳහා බේරුම්කරණය ඉතා සුලභව භාවිතා කරනු ලැබීය.
- වර්තමානයේදී වාණිජ සහ කම්කරු ආරවුල් මෙන්ම අන්තර්ජාතික ආරවුල් සම්බන්ධයෙන්ද බේරුම්කරණය බහුලව භාවිතා කෙරේ.
- බේරුම්කරණයේදී බේරුම්කරුවෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් දෙපාර්ශවයම එකඟ විය යුතු අතර බේරුම්කරුගේ තීරණය සම්බන්ධයෙන් ඔවුන් බැඳී සිටින බවට පාර්ශවයන් සහතික වීමද සිදු විය යුතුය.
- ජාත්‍යන්තර නීතිය පිලිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසමේ ආදර්ශ බේරුම්කරණ නීතිය සැකසීම, නීතිමය සහ වාණිජ ලෝකයේ ඉතා වැදගත් අවස්ථාවක් බවට සාක්ෂාත් කර ඇත.
- ඒ අනුව ලොව බොහෝ රටවල් එක්සත් ජාතීන්ගේ නිර්දේශ/ ආදර්ශ/ මොඩියුල ප්‍රකාරව බේරුම්කරණ නීති නැවත සකස් කරන ලදී.
- ශ්‍රී ලංකාවද ඒ අනුව 1995 අංක 11 දරණ බේරුම්කරණ පනත පනවන ලදී.

# 1995 බේරුම්කරණ පනතේ අරමුණු

- ⏭⏭ බේරුම්කරණ නීති කෘත්‍යයන් පැවැත්වීම පිණිස සහ බේරුම්කරණ තීරණ බලාත්මක කරවා ගැනීම සඳහා සවිස්තරාත්මක නීති ප්‍රතිපාදනයන් සැකසීම

- ⏭⏭ 1995 විදේශ බේරුම්කරණ තීරණ පිළිගැනීමේ නිව්යෝර්ක් සම්මුතියේ මූලධර්මයන් සඳහා බලාත්මකභාවය ලබා දීම

JMC vLearning
"your virtual learning partner"

# බේරුම්කරණ ගිවිසුම සහ අධිකරණ කාර්ය පටිපාටිය

- බේරුම්කරණ ගිවිසුමක් ලිඛිත විය යුතුය. එය පාර්ශවකරුවන් විසින් අත්සන් කරන ලද ලියවිල්ලක් හෝ ගිවිසුම පිලිබඳ ලේඛණගතවීමක් සලසා ඇති ලිපි හුවමාරුවක හෝ ටෙලැක්ස් පණිවිඩවල හෝ විදුලි පණිවිඩ වල හෝ වෙනත් විදුලි සංදේශ මාර්ගයකින් අන්තර්ගත විය යුතුය.
- යම් කාරණයක් පිලිබඳ බේරුම්කරණ ගිවිසුමකට එලඹ ඇත්නම් එය රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි වන්නේ නම් හෝ බේරුම්කිරීමකින් තීරණය කිරීමට නොහැකි වන්නේ නම් හෝ මිස බේරුම්කිරීම මගින් තීරණය කල හැකි බවට පනතෙහි සඳහන් වේ.



JMC vLearning "your virtual learning partner"

# බේරුම්කරණ විනිශ්චයාධිකාරියේ සංයුතිය

- බේරුම්කරණ විනිශ්චයාධිකාරියක සංයුතිය තීරණය කිරීමට පාර්ශවයන්ට නිදහස තිබිය යුතුය.
- බේරුම්කරුවන් සංඛ්‍යාව ඉරට්ටේ සංඛ්‍යාවක් වන අවස්ථාවකදී එසේ පත්කරන ලද බේරුම්කරුවන් විසින් සභාපතිවරයා ලෙස කටයුතු කිරීමට සාමූහිකව අතිරේඛව බේරුම්කරුවෙකු පත් කල යුතුය. එසේ නොවන අවස්ථාවකදී බේරුම්කරුවන්ගේ සංඛ්‍යාව තුනක් විය යුතුය.
- බේරුම්කරුවන් පත් කර ගැනීමේ කාර්ය පටිපාටිය පිලිබඳව එකඟතාවයකට එලඹීමට පාර්ශවකරුවන්ට නිදහසක් ඇති අතර එසේ එකඟවීමක් නොමැති අවස්ථාවකදී බේරුම්කරුවන් පත්කිරීමට මහාධිකරණයට හැකියාව ඇත.

JMC vLearning "your virtual learning partner"

# බේරුම්කරණ විනිශ්චයාධිකාරයක බලතල

- අධිකරණ බලය පිලිබඳ තීරණය කිරීම
- සියලු කාරය පටිපාටිමය කාරණා සහ සාක්ෂිමය කාරණා තීරණය කිරීම
- විශේශඥයන්, නීති උපදේශකයන් සහ තක්සේරුකරුවන් පත් කිරීම
- ගාස්තු සඳහා සුරක්ෂිතයක් නියම කිරීම
- සාක්ෂිකරුවෙකු දිවුරුමක් මත හෝ ප්‍රතිඥාවක් මත විමසිය යුතු බවට නියම කිරීම
- තාවකාලික නියෝග නිකුත් කිරීම
- යම් මුදලක් ගෙවන ලෙසට නියම කිරීම
- යම්කිසි දෙයක් සිදු කිරීමෙන් පාර්ශවකරුවෙකු වැලැක්වීමට ( වාරණය කිරීමට ) නියෝග කිරීම

# බේරුම්කරුවෙකුගේ අධිකාරිය අවසන් කිරීම

- එය පහත ක්‍රම වලට සිදුවේ.
- ⚡⚡ බේරුම්කරුවෙකුට ස්වකීය දූරයේ කාර්යයන් ඉටුකිරීමට නොහැකි වුවහොත්
- ⚡⚡ අනිසි ප්‍රමාදයකින් තොරව ක්‍රියා කිරීමට බේරුම්කරු අපොහොසත් වුවහොත්
- ⚡⚡ බේරුම්කරුවෙකු මියගියහොත්
- ⚡⚡ බේරුම්කරුවෙකුගේ ධුරය අවසන් කිරීම පිලිබඳව පාර්ශවකරුවන් එකඟ වුවහොත් ( එහෙත් මේ පිලිබඳව පනතේ ප්‍රතිපාදන නැත )

- ⚡⚡⚡⚡ බේරුම්කරුවෙකුගේ අනිසි ප්‍රමාදයකදි ඔහුව ඉවත් කරන ලෙසට හෝ ඔහු වෙනුවට වෙනත් අයෙකුව පත් කරන ලෙසට අගතියට පත් පාර්ශවයක් විසින් මහාධිකරණයක් වෙත ඉල්ලීමක් සිදු කල හැකිය.
- ⚡⚡⚡⚡ බේරුම්කරුවෙකුගේ අධිකාරිය අවසන් කරනු ලැබීමකදී පාර්ශවකරුවන් අන්‍යාකාරයකින් එකඟ වන්නේ නම් මිස එම නීති කෘත්‍ය මුල සිට නොපැවැත්විය යුතුය.

- ❤❤ බේරුම්කරණ තීරණ අභියෝගයට ලක් කිරීම සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තේ මහාධිකරණයටය. ( බේරුම්කරණ තීරණ මෙන්ම බේරුම්කරුවන් පත්කිරීමද මෙසේ අභියෝගයට ලක් කල හැකිය )
- ❤❤ බේරුම්කරුවන් විසින් අපක්ෂපාතී , ප්‍රායෝගික සහ කඩිනම් ආකාරයෙන් ක්‍රියා කල යුතුය.
- ❤❤ බේරුම්කරණයේදී ඊට අදාල පාර්ශවයන්ට තමන් විසින්ම හෝ තමා වෙනුවෙන් නීතීඥවරයෙකු මාර්ගයෙන් ලිඛිතව හෝ වාචිකව කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබිය යුතුය.
- ❤❤ ආරවුලට සම්බන්ධ පාර්ශවයන්ගේ එකඟතාවය මත බේරුම්කිරීමේ ස්ථානය තීරණය කල හැකිය. එසේ නොවන විටකදී පාර්ශවයන්ගේ පහසුව ආදී කරුණු සැලකිල්ලට ගෙන බේරුම්කරණ විනිශ්චයාධිකාරිය විසින් අදාල ස්ථානය තීරණය කල යුතුය.
- බේරුම්කරණ විනිශ්චයාධිකාරියේ අවසාන තීරණය බහුතර මතය අනුව විය යුතුය. බහුතරයක් නොමැති අවස්ථාවකදී සෙසු බේරුම්කරුවා විසින් පත් කරනු ලැබූ බේරුම්කරුවා විසින් ගනු ලැබූ තීරණය හෝ සභාපති විනිසුරුවරයෙකු සිටී නම් එම සභාපති විනිසුරුවරයාගේ තීරණය අනුගම්‍ය විය යුතුය.
- ❤❤ බේරුම්කරණ විනිශ්චයාධිකාරියක් ඉදිරියේ පෙනී සිටීම පැහැර හැරීමකදී හෝ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් සිදුකිරීම ප්‍රතික්ෂේප කිරීමක් සඳහා දණ්ඩණයක්ද පනවා ඇත.

- ❤❤ බේරුම්කරණයේදී ලබා දෙන සාක්ෂි පාර්ශවකරුවන් විසින් අන්‍යාකාරයකින් එකඟතාවයකට එලඹ ඇත්නම් මිස ලිඛිතව , වාචිකව හෝ දිවුරුම් ප්‍රකාශ මගින් ලබා දිය හැකිය.
- ❤❤ පාර්ශවකරුවන් අන්‍යාකාරයකින් එකඟව ඇත්නම් මිස බේරුම්කරණ ගිවිසුම යටතේ නීති කෘත්‍ය කරගෙන යාමේ කාර්යය සඳහා බේරුම්කාර විනිශ්චයාධිකාරියක් සාක්ෂි ආඥා පනතේ ප්‍රතිපාදන වලින් බැඳී නැත.
- ❤❤ බේරුම්කරුවන්ට ඔවුන්ගේ වැඩ සහ වියදම් සඳහා සාධාරණ වන්දියක් ගෙවීම සඳහා ආරවුලට සම්බන්ධ පාර්ශවයන් එක්ව සහ වෙන් වෙන් වගකිව යුතු බවට ප්‍රතිපාදන බේරුම්කරණ පනත තුල ඇත.
- ❤❤ බේරුම්කරුවන්ගේ තීරණ ලිඛිතව විය යුතු අතර ඊට බේරුම්කරුවන් අත්සන් කර තිබිය යුතුය.
- ❤❤ බේරුම්කරණ තීරණයක් බලාත්මක කරවා ගැනීම සඳහා එම තීරණය ප්‍රධානය කර දින 14 කට පසු සහ වසරක් තුල මහාධිකරණයක් වෙත ඉල්ලීමක් කල යුතුය.
- ජාත්‍යන්තර වෙලඳ නීතිය පිලිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසමේ අංාදර්ශ නීති වල දක්වා ඇති ආකාරයට හරයාත්මකව සමාන වන්නාවූ පදනම මත මහාධිකරණයට බේරුම්කරණ තීරණයක් ඉවත් කල හැකිය.